ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

# පුවත්පත් නිවේදනය

## දෙවෙන පළාත් පාලන නියෝජිත කණ්ඩායම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහනක්

ශ්‍රී ලංකාවේ දෙවෙන පළාත් පාලන නියෝජිත කණ්ඩායම සඳහා හයිදරාබාද් හි ග්‍රාමීය සංවර්ධනය සහ පංචායති රාජ් පිළිබඳ ජාතික ආයතනයේදී දින 10ක් පුරා පැවති ධාරිතා සංවර්ධන වැඩසටහන සාර්ථකව අවසන් විය. ඉන්දීය සම්භවයක් සහිත දෙමළ සහ ශ්‍රී ලංකා දෙමළ පළාත් පාලන නියෝජිතයන් 30 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් මේ සඳහා සහභාගි වූහ.

2. මෙම වැඩසටහන මාර්තු 9-18 දක්වා තෙලංගනා සහ තමිල්නාඩු යන ප්‍රාන්ත දෙක ආවරණය කරමින් පැවැත්විණ. දෙමළ ප්‍රගතිශීලි සන්ධානයේ නියෝජිතයන් 20 දෙනෙකු සහ ඉලංගයි තමිල් අරසු කච්චි පක්ෂයේ නියෝජිතයන් 10 දෙනෙකු මෙම කණ්ඩායමට ඇතුළත් විය. පළාත් සභා නියෝජිතයන් 20 දෙනෙකුගෙන් සමන්විත වූ පළමු කණ්ඩායම 2026 ජනවාරි 19 සිට 29 දක්වා එම ආයතනයේ ම පැවති පුහුණු වැඩසටහනකට සහභාගි වූහ.

3. අන්තර් ක්‍රියාකාරි සැසි සහ ක්ෂේත්‍ර චාරිකා ඇතුළත් වූ පුහුණු වැඩසටහන තුළින් තිරසාර සංවර්ධන අභිමතාර්ථයන් අතරින් වැදගත්ම තේමාවන් නවයක් සම්බන්ධයෙන් වන මනා පිළිවෙත් පෙන්වා දෙන ලදී. එම තේමාවන් නවය වන්නේ දුප්පත්කම නොමැති සහ වැඩි දියුණු කරන ලද ජීවනෝපායන් සහිත පංචායත්; නීරෝගිමත් ගම්මාන; ළමා මිතුරු පංචායත්, ජලයෙන් ස්වයං පෝෂිත ගම්මාන; පිරිසිදු සහ හරිත ගම්මාන; ස්වයං පෝෂිත යටිතල පහසුකම්; සාමාජීය වශයෙන් ආරක්ෂිත ගම්මාන; යහ පාලනයක් සහිත ගම්මාන සහ කාන්තා මිතුරු ග්‍රාම් පංචායත් යනාදිය යි. මෙයට අමතරව, දූත පිරිසට ප්‍රාථමික සෞඛ්‍ය සහ අධ්‍යාපනය, අයවැයකරණය, පරිසර හිතකාමී සංචාරක කර්මාන්තය වැනි අංශ සම්බන්ධයෙන් ද දැනුම සහ අවබෝධය ලබා දෙන ලදී.

3. දූත පිරිස සඳහා ප්‍රාථමික සෞඛ්‍ය සේවා පහසුකම්, අන්ගන්වඩි මධ්‍යස්ථාන, සමුපකාර බැංකු, කාන්තාවන්ගේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක කිරි ගොවිපොළවල්, පලතුරු සහ උද්‍යාන විද්‍යා පර්යේෂණ මධ්‍යස්ථාන සහ නිල්ගිරිස් හි තේ වගාවන් ඇතුළු විවිධ දේශීය ආයතන වෙත සංචාර ද සංවිධාන කර තිබිණ. ශ්‍රී ලංකාවේ පළාත් සභා නියෝජිතයන් සඳහා විශේෂයෙන් සකසන ලද මෙම වැඩසටහනෙහි

අරමුණ වූයේ දැනුම හුවමාරුව ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රාදේශීය මට්ටමේ පාලනය යන ක්ෂේත්‍රය තුළ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ආයතනික සබඳතා ශක්තිමත් කිරීම යි.

4. ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා සිය 2025 අප්‍රේල් සංචාරය අතරතුර දී ශ්‍රී ලාංකික වෘත්තිකයන් 700 දෙනෙකු සඳහා විශේෂයෙන් සකසන ලද පුහුණු අවස්ථා 700ක් පිරිනමන බව ප්‍රකාශ කළ අතර මෙම වැඩසටහන එම වැඩි දියුණු කරන ලද ධාරිතා සංවර්ධන රාමුව යටතේ සංවිධාන කරන ලදී.

***

**කොළඹ**

***2026* මාර්තු *19***